# අයවැය ලේඛනය - 2025
# வரவு செலவு திட்டம் - 2025
# Budget Report - 2025




රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

**ருவன்வெல்ல பிரதேச சபை**

*Ruwanwella Pradeshiya Sabha*

# පටුන


| | | |
|---|---|---|
| 01. | රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ අයවැය සම්මත කිරීම | 01 |
| 02. | රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ මෙහෙවර ප්‍රකාශය සහ දැක්ම | 02 |
| 03. | රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව පිළිබඳ හැඳින්වීම | 03 |
| 04. | රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමාගේ අයවැය ප්‍රකාශය | 04 |
| 05. | රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සංවිධාන සටහන | 05 |
| 06. | රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සිතියම | 06 |
| 07. | මිනිස් බල සාරාංශය | 07 - 08 |
| 08. | පොදු සංඛ්‍යා ලේඛන තොරතුරු | 09 -11 |
| 09. | 2025 වර්ෂයේ ආදායම් සාරාංශය | 12 |
| 10. | 2025වර්ෂයේ වියදම් සාරාංශය | 13 |
| 11. | 2025 වර්ෂයේ ආදායම් වියදම් සාරාංශය | 14 |
| 12. | 2025 වර්ෂයේ අයවැය සාරාංශය | 15 |
| 13. | 2025 පුනරාවර්තන වියදම් හා පුනරාවර්තන ආදායම් ව්‍යුහය | 16 |
| 14. | වැඩසටහන් අංක 01 - පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල තොරතුරු<br>ආදායම් වියදම් ඇස්තමේන්තුව | 17-29 |
| 15. | වැඩසටහන් අංක 02 - සෞඛ්‍ය සේවා<br>ආදායම් වියදම් ඇස්තමේන්තුව | 30-43 |
| 15. | වැඩසටහන් අංක 03 - භෞතික සැලසුම් මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි<br>ආදායම් වියදම් ඇස්තමේන්තුව | 44-58 |
| 16. | වැඩසටහන් අංක 05 - මහජන උපයෝගීතා සේවා<br>ආදායම් වියදම් ඇස්තමේන්තුව | 59-67 |
| 17. | වැඩසටහන් අංක 06 - සුභ සාධන සේවා හා විහරණ<br>ආදායම් වියදම් ඇස්තමේන්තුව | 68-78 |

**<u>2025 වර්ෂයේ කෙටුම්පත් අයවැය ලේඛනය සාකච්ඡා කිරීම සඳහා 2024.11.07 දින පැවති කමිටු රැස්වීම.</u>**

2025 වර්ෂය සඳහා සකස් කරන ලද අය වැය ලේඛනය පරීක්ෂා කළ අතර එය ඉදිරි වසර සඳහා රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාත්මක කිරීම සුදුසු බව, 1987 අංක 15 දරන පනතේ 9(3) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරමි.

P.R. පතිරණ,
ලේකම්,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

පී.ආර්. පතිරණ
ලේකම් හා බලතල, කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

2024.11.07 දින
රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

# දැක්ම

සැමට සමෘද්ධිමත් අනාගතයක්

# මෙහෙවර ප්‍රකාශය

පවත්නා සම්පත් මනා කළමනාකාරීත්වයකින් යුතුව උපයෝගී කරගනිමින් ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාවන් සාමුහිකව, කැපවීමෙන් සාධාරණව හා ඵලදායීව ඉටු කිරීම අපගේ මෙහෙවර වේ.

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව පිළිබඳ හැදින්වීම.

පැරණි ගම් සභා ක්‍රමය යටතේ පාලනය වූ *මෙගොඩපොත* හා එගොඩගොඩපත්තුව වශයෙන් තිබූ ගම්සභා කොට්ඨාශ දෙකකින් කොටස් එකතු කර රුවන්වැල්ල ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශයට (වර්තමාන රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය) අනුරූපී වන පරිදි 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත යටතේ රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව ප්‍රතිස්ථාපනය කර ඇත. මෙම ප්‍රාදේශීය සභාව සඳහා 1987 වසරේදී නාම යෝජනා කැඳවූ නමුත් ප්‍රාදේශීය සභා මැතිවරණයක් නොපැවැත්වූ හෙයින් 1991 වර්ෂය දක්වා විශේෂ කොමසාරිස්වරයකු යටතේ පාලනය විය. ප්‍රථම වරට 1991 දී පැවැත්වූ ප්‍රාදේශීය සභා මැතිවරණය අනුව තේරිපත් වූ සභාපතිවරයෙකු හා සභිකයින් මඟින් ද, දෙවන වරට 1997 වසරේ පැවැත්වූ ප්‍රාදේශීය සභා මැතිවරණය අනුව තේරිපත්වූ සභාපතිවරයෙකු හා සභිකයින් මඟින්ද, තුන්වන වරට 2002 මාර්තු මස පැවැත්වූ ප්‍රාදේශීය සභා මැතිවරණයෙන් තේරිපත්වූ සභාපතිවරයෙකු ඇතුළු සභිකයින් මඟින්ද, 2006 අප්‍රේල් පැවැත්වූ මැතිවරණයෙන් තේරිපත්වූ සභාපතිවරයෙකු ඇතුළු සභිකයින් මඟින්ද, 2011.01.05 වන දින දක්වා මෙම ප්‍රාදේශීය සභාව පාලනය විය.

ඉන්පසු 2011.01.06 දින සිට 2011.07.31 වන දින දක්වා බලයලත් නිලධාරිවරයෙකු යටතේ පාලනය විය. 2011 ජූලි මස 23 වන දින පැවැත්වූ ප්‍රාදේශීය සභා මැතිවරණය අනුව පස්වන වරටත් තේරි පත් වූ සභාපතිවරයෙකු හා මන්ත්‍රී මණ්ඩලයක් යටතේ 2015.07.31 වන දින දක්වාත් 2015.08.01 වන දින සිට 2018.03.26 වන දින දක්වා විශේෂ කොමසාරිස්වරයෙකු යටතේත් සභාවෙහි සියලු කටයුතු පාලනය විය.

2018.02.10 වන දින පැවති ආසන්නතම ප්‍රාදේශීය සභා මැතිවරණයේ දී තේරිපත් වූ සභාපති ප්‍රමුඛ මන්ත්‍රී මණ්ඩලය විසින් 2023.12.19 දින දක්වා රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව පාලනය වූ අතර, 2023.02.20 දින සිට පළාත් පාලන කොමසාරිස් බලතල යටතේ ප්‍රාදේශීය සභාවේ ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී ලෙස වර්තමානයේ P.R.පතිරණ මහතා ප්‍රාදේශීය සභාවේ ප්‍රධානත්වය දරයි.

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ගරු ලේකම්තුමාගේ අයවැය ප්‍රකාශය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 186 වන වගන්තිය හා 1989 අප්‍රේල් 17 දිනැති අංක 554/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාර මූල්‍ය හා පරිපාලන රීති මාලාවේ 2 වන නීතිය අනුව,රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂය වෙනුවෙන් මෙම අයවැය ලේඛනය සකස් කර ඇත.

ග්‍රාම නිලධාරී වසම් 38 ක් හා වර්ග කි.මී.147 ක් වන රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගනිමින් ප්‍රාදේශීය සභා පනතින් අප වෙත පැවරී ඇති බල තල ප්‍රකාරව මහජනතාව වෙත සැපයිය යුතු සේවාවන් වඩාත් උසස් මට්ටමින් ප්‍රමිති සහගතව ලබා දෙමින් අපගේ වගකීම් හා යුතුකම් කොටස ඉටුකිරීමට මෙම අයවැය ලේඛනය පෙරමං දරනු ඇත.

මෙම සටහන තබන 2024.11.09 දින වන විට , පසුගිය ප්‍රාදේශීය සභික ධුර කාලය අවසන්ව ඇති අතර,2024.11.07 දින පැවැත්වූ ප්‍රතිපත්ති හා තීරණ ගැනීමට සහය වීමේ කමිටුව විසින් අංක 33 යටතේ නිර්දේශ කර ඇති මෙම අයවැය, ප්‍රාදේශීය සභා පනතේ (9) 3 වගන්තිය අනුව රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරියා වශයෙන් 2024.11.09 දින මෙකී අයවැය ලේඛනය මා විසින් අනුමත කරන ලදුව 2025 වර්ෂය තුළ මෙම අයවැය ලේඛනය පදනම්ව කටයුතු කිරීමටත් ,ආයතනයේ කටයුතු අවිච්ඡින්නව පවත්වාගෙන යාමටත් හැකිවනු ඇත.

රජයේ ආයතනයක් වශයෙන් රාජ්‍ය ප්‍රතිපත්ති අනුව කටයුතු කරමින්, ජනතාවට වඩාත්ම සමීපතම රජයේ ආයතනයක් ලෙස ජනතාව අතර ඇති විශ්වාසය වඩාත් තහවුරු කරමින්, අපගේ දැක්ම මෙහෙවර අනුව කටයුතු කිරීම අපගේ බලාපොරොත්තුවයි.එමෙන්ම මෙම අයවැය ලේඛනය තුළ ආයතනයේ අභිලාසයන්ද ,ජනතා අභිලාසයන්ද සාර්ථක වනු දැකීම අපගේ අපේක්ෂාවයි.

අයවැය ලේඛනය සැකසීමේ සිට අනුමත කෙරෙන මොහොත දක්වා කටයුතු කළ සහ අනුමත කළ අයවැය ලේඛනය පරිදි 2025 වර්ෂයේදී කටයුතු කරන රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සියලු කාර්ය මණ්ඩලය ස්තුතිපූර්වකව සිහිපත් කරන අතර නන් අයුරින් සහය වූ සැමට ප්‍රණාමය පුද කරමි. 2025 වර්ෂය ඔබ සියලුම දෙනාගේ යහපත් බලාපොරොත්තු,අපේක්ෂා,ප්‍රාර්ථනා මල්ඵල ගැන්වෙන වසරක් වේවායි සුභ පතමි.

පී.ආර්. පතිරණ,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
රුවන්වැල්ල.

# කාර්යාල සංවිධාන සටහන



රුවන්වැල්ල ප්‍රාදේශීය බල ප්‍රදේශයේ සිතියම

ருவன்வல்லை பிரதேச சபை அதிகார எல்லையின் வரைபடம்

# Map of the Ruwanwella Pradeshiya Sabha Administrative Limit



# සේවක සංඛ්‍යාව

| තනතුර / සේවය | අනුමත කාර්ය මණ්ඩලය | 25/2014 සමහ දරන්නාට පුද්ගලික සේ අනුමත සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ස්ථිර | අභ්‍යාසලාභී | අනියම් | සේවා ගිවිසුම් මත සේවය කරන සංඛ්‍යාව | අනුයුක්ත | කොන්ත්‍රාත් | පුරප්පාඩු |
| ලේකම් - කළමනාකරණ සේවා නිලධාරී අධි ශ්‍රේණිය | 01 | | - | - | - | - | - | - | 01 |
| කළමනාකරණ සේවා නිලධාරී | 13 | | 11 | - | - | - | - | - | 02 |
| සංවර්ධන නිලධාරී | 21 | | 21 | - | | - | 01 | | 0 |
| කාර්මික නිලධාරී | 03 | | 03 | - | - | - | - | | 0 |
| සැලසුම් ශිල්පී | 01 | | 01 | - | - | - | - | | 0 |
| පුස්තකාලයාධිපති | 06 | | 02 | - | - | - | - | | 04 |
| පොදු වෙළඳ සැල් පරිපාලක | 01 | | 0 | - | - | - | - | | 01 |
| පෙර පාසල් පාලිකා | 02 | | 02 | - | | - | - | | 0 |
| ආදායම් පරීක්ෂක | 02 | | 02 | - | - | | - | | 0 |
| ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථාන භාරකරු | 01 | | 0 | - | - | - | - | | 01 |
| වැඩ ක්ෂේත්‍ර පරිපාලක | 01 | | 0 | - | - | - | - | | 01 |
| තාක්ෂණික සහකාර | 01 | | 0 | - | - | - | - | | 01 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| රියදුරු | 05 | | 04 | - | - | - | - | | 01 |
| ❖ රියදුරු | - | 05 | 05 | - | - | - | - | | 0 |
| යන්ත්‍ර ක්‍රියාකරු | 01 | - | 0 | | - | - | - | | 1 |
| විදුලි කාර්මික | 01 | - | 01 | - | - | - | - | | - |
| පුස්තකාල සහයක | 06 | - | 0 3 | | - | - | - | | 03 |
| ❖ පුස්තකාල සහයක | - | 03 | 03 | - | - | - | - | | - |
| කාර්යාල කාර්ය සහායක | 03 | - | 04 | | 01 | - | | | 0 |
| මුරකරු | 05 | - | 04 | - | - | - | - | | 01 |
| ❖ මුරකරු | - | 05 | 05 | - | - | - | - | | - |
| වැඩ ක්ෂේත්‍ර කම්කරු | 27 | - | 15 | - | - | 01 | - | | 12 |
| ❖ වැඩ ක්ෂේත්‍ර කම්කරු | | 06 | 06 | - | | | | | 0 |
| සෞඛ්‍ය කම්කරු | 09 | | 09 | | | 12 | | | 0 |
| ❖ සෞඛ්‍ය කම්කරු | | 02 | 02 | | | | | | 0 |
| ආදාහනාගාර සහායක | | | | | | 01 | | | |
| රසායනාගාර සහායක | | | | | | 01 | | | |
| එකතුව | 110 | 21 | 103 | - | 01 | 15 | 01 | - | 29 |

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව - පොදු සංඛ්‍යා ලේඛන තොරතුරු
## 2023 ප්‍රා.ලේ.කාර්යාල සම්පත් පැතිකඩ සංඛ්‍යා ලේඛනයට අනුව

### 01. පොදු තොරතුරු

| | |
|---|---|
| පළාත | - සබරගමුව |
| පරිපාලන දිස්ත්‍රික්කය | - කෑගල්ල |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | - රුවන්වැල්ල |
| මැතිවරණ කොට්ඨාසය | - රුවන්වැල්ල |
| බල ප්‍රදේශයේ විශාලත්වය 147 | - වර්ග කි.මී. |
| ග්‍රාම නිලධාරී කොට්ඨාස ගණන | - 38 |
| මුළු ජනගහනය (ස්ත්‍රී/පුරුෂ) | - 71324 |
| ග්‍රාමීය | - 58717 |
| නාගරික | - 1672 |
| අර්ධ නාගරික | - 6210 |
| වතු | - 4725 |
| ස්ත්‍රී | - 37095 (52%) |
| පුරුෂ | - 34229 (48%) |
| පවුල් සංඛ්‍යාව | - 18989 |
| නිවාස සංඛ්‍යාව (ස්ථිර,අර්ධ,තාවකාලික) | - 18482 |
| ජන ඝණත්වය (වගර් කි.මී. 1 ට ) | - 485 |

### 02. ජාතීන් අනුව

| | |
|---|---|
| සිංහල | - 62058 |
| දෙමළ | - 5291 |
| මුස්ලිම් | - 3975 |
| බර්ග | - - |
| මැලේ | - - |
| වෙනත් | - - |

### 03. ආගම් වර්ග අනුව සංඛ්‍යාව

| | |
|---|---|
| බෞද්ධ | - 61525 (83.22% |
| හින්දු | - 4910 (6.13%) |
| ඉස්ලාම් | - 4330 (8.74%) |
| කතෝලික | - 543 (1.8%) |
| වෙනත් | - 16(0.11%) |

(2023 වර්ෂයේ සංඛ්‍යා ලේඛන තොරතුරු අනුව)

| | |
|---|---|
| ලියාපදිංචි ඡන්ද දායක සංඛ්‍යාව | - 52769 |

**සේවක සංඛ්‍යාව**

| | |
|---|---|
| සේවයේ නියුතු ස්ථිර සේවක මණ්ඩලය | - 103 |
| ආදේශක /අනියම් /ශ්‍රම පදනම මත සේවක සංඛ්‍යාව | - 16 |

**දුරකථන අංක**

| | |
|---|---|
| කාර්යාලය දුරකථන අංක | - 0362266275<br>036 2267275 |
| Megaline new connection | - 036 2265275 |
| ෆැක්ස් අංකය | - 0362267275 |
| රුවන්වැල්ල මහජන පුස්තකාලය | - 0362267379 |
| ඊමේල් ලිපිනය | ruwanwellaps @gmail.com |

**වාහන යන්ත්‍ර සූත්‍ර හා උපකරණ**

| | |
|---|---|
| ට්‍රැක්ටර් (SGRB-4782, SGGX-4486, SGRC-1524, SGRD-4370 SGRD-8013, SGRD-8244, SGRC1412,GGRG2256, SGRC6950,49-7108 ) | - 10 |
| ට්‍රේලර් (SGJB-5989, SGRV-8558, SGRW-2091, SGRW-9018 SGRX-2005, SGRX-2067, SGRX-2070,SGRX-2329,67-0126) | - 09 |
| කම්පැක්ටර් (RX4401) | - 01 |
| ගලි බවුසර (SGRW 2123, SGLP2244) | - 02 |
| ජල බවුසර( RW-4652) | - 01 |
| මිට්ෂුබිසි කැබ් රථ 252-6350/WPPF 7490 | - 02 |
| මහතේද්‍රා කැබ් රථය SGLF-4866 | - 01 |
| කෘ කැබ් රථය (ෆෝටෝන්) SGLL 7644 | - 01 |
| යතුරු පැදි BAL 6669 | - 01 |
| බැකෝ යන්ත්‍ර SGRS 1796 / SGZA 5198 | - 02 |
| මෝටර් ග්‍රේඩර් SGZA 5391 | - 01 |
| ටිපර් රථ SGLL 7059 | - 01 |
| ලොකු ජල බවුසර් SGLL 7318 | - 01 |
| ගාබේජ් කම්පැක්ටරය SGLM 5629 | - 01 |
| පාපැදි | - 01 |
| තණකොළ කපන මැෂින් | - 06 |
| ලෙලෙන තලනය | - 01 |
| බොබ්කැට් යන්ත්‍රය | - 01 |
| කම්පන තලනය | - 02 |
| දම්වැල් කියත් යන්ත්‍රය | - 02 |
| අධි පීඩන වතුර විදිනය | - 02 |
| පරිගණක යන්ත්‍ර | - 13 |
| මුද්‍රණ යන්ත්‍ර | - 07 |
| ෆැක්ස් යන්ත්‍ර | - 01 |
| ඡායා පිටපත් යන්ත්‍ර | - 02 |
| ඇඟිලි සළකුණු යන්ත්‍රය | - 01 |
| ජෙනරේටරය | - 01 |
| මෝටර් බෝට්ටු | - 02 |
| ඔරු | -02 |
| ලැප්ටොප් | -02 |

**සභාවෙන් සපයනු ලබන සේවා**

| | |
|---|---|
| ඉදිකල කාණු දිග | - 450 m |
| ළිං | - 170 |
| නාන තොටුපලවල් | - 15 |
| සුසාන භූමි (සභාව සතු) | - 07 |
| ක්‍රීඩා පිටි | - 04 |
| ළමා උද්‍යාන | - 01 |
| පුස්තකාල | - 05 |
| පොදු ජල කරාම | - 04 |
| පොදු වැසිකිලි | - 05 |
| වීථි ලාම්පු | - 2875 |
| ආදාහනාගාර | -01 |
| ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය (ඉදල්පොල කසල අංගනය) | -01 |
| මලපවාහන පද්ධතිය ඉදල්පොල | -01 |
| නිදහස් ආයුර්වේද | -01 |
| පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන (සභාව සතු) | -02 |
| පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන(දිමනා ගෙවන) | -02 |

පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන(දීමනා ගෙවන) -02

මාර්ග සංඛ්‍යාව - තාර දැමූ 90.35 km

- බොරළු දැමූ 216.87 km

- කොන්ක්‍රීට් 59.50 km

**<u>ආදායම් තොරතුරු</u>**

වරිපනම් අයකරන දේපල සංඛ්‍යාව - 3533

**අයකරන වරිපනම් ප්‍රතිශතය**

නගර සීමාව - 7%

දියුණු ගම් ප්‍රදේශ - 4 %

අක්කර බදු අය කරන දේපල සංඛ්‍යාව - 538

අක්කර බදු අය කරන භූමි ප්‍රමාණය හෙක්ටයාර් - 4212.25

වෙළඳ බලපත්‍ර සංඛ්‍යාව - 277

ව්‍යාපාර බදු ගෙවන සංඛ්‍යාව - 1006

පොදු වෙළඳපල (රුවන්වැල්ල) කඩ කාමර - 68

පොදු වෙළඳ පල යාවූ කඩ කාමර - 16

අගුරුවැල්ල නව කඩ කාමර - 10

පොදු වෙළඳ පල (අගුරුවැල්ල ) කඩ කාමර - 21

රන්වැලි වෙළඳ සංකීර්ණය - 16

රන්වැලි වෙළඳ සංකීර්ණය හා පොදු වෙළඳ පල අතර කඩ කාමර - 31

පදික වෙළඳසැල් - 03

අගුරුවැල්ල තාවකාලික වෙළඳ කුටි - 08

අගුරුවැල්ල නගරයේ වම්පස පසට අයත් කඩ කාමර - 09

සංවර්ධන කුටි - 09

ගලපිටමඩ කඩකාමර - 13

**<u>මස්, මාළු කඩ හා සතිපොල සංඛ්‍යාව</u>**

කුකුල් මස් කඩ - 01

එළු මස් කඩ - 01

හරක් මස් කඩ - 01

මාළු කඩ සංඛ්‍යාව (වෙළඳ අයිතිය) - 03

කරවල කඩ - 01

මාළු කඩ සංඛ්‍යාව - 03

සතිපොල (සභාව සතු) - 02

# රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

## ආදායම් සාරාංශය-2025

| විස්තරය | 1 වැඩ සටහන | 2 වැඩ සටහන | 3 වැඩ සටහන | 5 වැඩ සටහන | 6 වැඩ සටහන | එකතුව | ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|
| | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි | මහජන උපයෝගිතා | සුභ සාධන සේවා | | |
| පුනරාවර්තන ආදායම් | | | | | | | |
| 1. වරිපනම් හා බදු | 5,122,360.00 | 800,000.00 | 500,000.00 | | 200,000.00 | 6,622,360.00 | 4% |
| 2. කුලී | | | 3,219,000.00 | 21,601,700.00 | 500,000.00 | 25,320,700.00 | 15% |
| 3. බලපත්‍ර ගාස්තු | 200,250.00 | 670,000.00 | | | | 870,250.00 | 1% |
| 4. සේවා සඳහා ගාස්තු | 150,000.00 | 4,465,000.00 | 900,000.00 | 1,000.00 | 35,000.00 | 5,551,000.00 | 3% |
| 5. වරෙන්තු ගාස්තු | 11,368,120.00 | 10,000.00 | 175,000.00 | 245,000.00 | 40,000.00 | 11,838,120.00 | 7% |
| 6. වෙනත් ආදායම් | 22,200,000.00 | 100,000.00 | 200,000.00 | | 50,000.00 | 22,550,000.00 | 13% |
| 7.ආදායම් ආධාර | 48,056,440.00 | 19,397,766.40 | 9,315,000.00 | 6,010,480.00 | 18,457,717.60 | 101,237,404.00 | 58% |
| එකතුව | **87,097,170.00** | **25,442,766.40** | **14,309,000.00** | **27,858,180.00** | **19,282,717.60** | **173,989,834.00** | 100% |
| | | | | | | | |
| පුනරාවර්තන වියදම් එකතුව | 66,836,970.00 | 35,650,766.40 | 15,095,000.00 | 12,624,380.00 | 25,932,717.60 | 156,139,834.00 | |
| | | | | | | | |
| පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ/ අඩුවූ ආදායම | 20,260,200.00 | (10,208,000.00) | (786,000.00) | 15,233,800.00 | (6,650,000.00) | 17,850,000.00 | |

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

### වියදම් සාරාංශය-2025

| විස්තරය | 1 වැඩ සටහන | 2 වැඩ සටහන | 3 වැඩ සටහන | 5 වැඩ සටහන | 6 වැඩ සටහන | එකතුව | ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|
| | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි | මහජන උපයෝගිතා | සුභ සාධන සේවා | | |
| පුනරාවර්තන වියදම් | | | | | | | |
| 1. වැටුප් හා වේතන | 49,134,280.00 | 22,653,640.00 | 9,445,000.00 | 7,063,080.00 | 19,460,780.00 | 107,756,780.00 | 69.01% |
| 2. ගමන් වියදම් | 850,000.00 | 150,000.00 | 25,000.00 | 9,300.00 | 20,000.00 | 1,054,300.00 | 0.68% |
| 3. සැපයුම් උපකරණ | 7,290,000.00 | 7,320,000.00 | 2,675,000.00 | 2,070,000.00 | 2,460,000.00 | 21,815,000.00 | 13.97% |
| 4. ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව | 3,800,000.00 | 2,400,000.00 | 2,600,000.00 | 2,000,000.00 | 1,450,000.00 | 12,250,000.00 | 7.85% |
| 5. ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 5,301,000.00 | 2,330,000.00 | 300,000.00 | 1,482,000.00 | 1,275,000.00 | 10,688,000.00 | 6.85% |
| 6. පොලී ගෙවීම් හා ලාභාංශ | | | | | | - | 0.00% |
| 7. ආධාර මුදල් හා දායක මුදල් | 315,000.00 | | | | 1,210,000.00 | 1,525,000.00 | 0.98% |
| 8. විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ | 146,690.00 | 797,126.40 | 50,000.00 | - | 56,937.60 | 1,050,754.00 | 0.67% |
| එකතුව | **66,836,970.00** | **35,650,766.40** | **15,095,000.00** | **12,624,380.00** | **25,932,717.60** | 156,139,834.00 | 100% |

# රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

## ආදායම් වියදම් සාරාංශය - 2025

| විස්තරය | 1 වැඩ සටහන | 2 වැඩ සටහන | 3 වැඩ සටහන | 5 වැඩ සටහන | 6 වැඩ සටහන | එකතුව |
|---|---|---|---|---|---|---|
| | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි | මහජන උපයෝගිතා | සුභ සාධන සේවා | |
| පුනරාවර්ථන වියදමට වඩා වැඩි වූ ආදායම | 20,260,200.00 | (10,208,000.00) | (786,000.00) | 15,233,800.00 | (6,650,000.00) | 17,850,000.00 |
| එකතු කලා | | | | | | - |
| ප්‍රාග්ධන අය | | | | | | - |
| ණය ලැබීම | | | | | | - |
| ප්‍රාග්ධන ආධාර ලැබීම | | | 40,500,000.00 | | | 40,500,000.00 |
| වෙනත් | | | | | | - |
| පුනරාවර්ථන හා ප්‍රාග්ධන ආදායම් වල එකතුව | 20,260,200.00 | (10,208,000.00) | 39,714,000.00 | 15,233,800.00 | (6,650,000.00) | 58,350,000.00 |
| අඩුකලා | | | | | | - |
| ප්‍රාග්ධන වැය | 450,000.00 | 1,000,000.00 | 55,500,000.00 | - | 1,400,000.00 | 58,350,000.00 |
| උපකරණ වැය | | | | | | - |
| ප්‍රාග්ධන වැය | | | | | | - |
| ඉඩම් ගොඩනැගිලි වැඩි දියුණු කිරීම | | | | | | - |
| ගොඩනැගිලි ප්‍රාග්ධන වැය | | | | | | - |
| 2024 වර්ෂයට අයවැය අතිරික්තය/ඌනතාවය | 19,810,200.00 | (11,208,000.00) | (15,786,000.00) | 15,233,800.00 | (8,050,000.00) | - |

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

### අය වැය සාරාංශය-2025

| ආදායම | | |
|---|---|---|
| වැඩසටහන | පුනරාවර්තන ආදායම | ප්‍රාග්ධන ආදායම |
| | රු.ශත | රු.ශත |
| පොදු පරිපාලනය | 87,097,170.00 | |
| සෞඛ්‍ය සේවා | 25,442,766.40 | |
| භෞතික සැලසුම් මංමාවත් හා ගොඩනැගිලි | 14,309,000.00 | 40,500,000.00 |
| මහජන උපයෝගී සේවා | 27,858,180.00 | |
| සුභ සාධක සේවා | 19,282,717.60 | |
| එකතුව | 173,989,834.00 | 40,500,000.00 |
| මුලු ආදායම් එකතුව | | 214,489,834.00 |

| වියදම | | |
|---|---|---|
| වැඩසටහන | පුනරාවර්තන වියදම | ප්‍රාග්ධන වියදම |
| | රු.ශත | රු.ශත |
| පොදු පරිපාලනය | 66,836,970.00 | 450,000.00 |
| සෞඛ්‍ය සේවා | 35,650,766.40 | 1,000,000.00 |
| භෞතික සැලසුම් මංමාවත් හා ගොඩනැගිලි | 15,095,000.00 | 55,500,000.00 |
| මහජන උපයෝගී සේවා | 12,624,380.00 | |
| සුභ සාධක සේවා | 25,932,717.60 | 1,400,000.00 |
| එකතුව | 156,139,834.00 | 58,350,000.00 |
| මුලු වියදම් එකතුව | | 214,489,834.00 |

| | |
|---|---|
| මුලු ආදායම | 214,489,834.00 |
| මුලු වියදම | 214,489,834.00 |
| අතිරික්තය/ඌනතාවය | 0.00 |

**2025 පුනරාවර්තන ආදායම් ව්‍යුහය**




1.වරිපනම් හා බදු
2.කුලී
3.බලපත්‍ර ගාස්තු
4.සේවා සඳහා ගාස්තු
5.වරෙන්තු ගාස්තු හා දඩ
6.වෙනත් ආදායම්
7.ආදායම් ආධාර

**2025 පුනරාවර්තන වියදම් ව්‍යුහය**




1.වැටුප් හා වේතන
2.ගමන් වියදම්
3.සැපයුම් හා උපකරණ
4.ප්‍රාග්ධන වත්කම් හා අළුත්වැඩියාව හා නඩත්තුව
5.ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා
6.පොලී ගෙවීම් හා ලාභාංශ
7.ආධාර මුදල් හා දායක මුදල්
8.විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ

# පොදු පරිපාලනය

# හා

# කාර්ය මණ්ඩල සේවා



## වැඩසටහන් අංක 01

## සාමාන්‍ය පරිපාලනය හා කාර්යය මණ්ඩල සේවා

**මෙම වැඩසටහනට අයත් කාර්යයන් පහත සඳහන් ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක කරනු ලබයි.**

01 - පොදු පරිපාලනය

02 - මූල්‍ය කටයුතු

03 - තක්සේරු කිරීම, ආදායම් එකතු කිරීම හා ප්‍රතිග්‍රහණය කිරීම

04 - අභ්‍යන්තර විගණනය

05 - කාර්යය මණ්ඩල පුහුණු කිරීම

06 - වත්කම් ආරක්ෂා කිරීම.

### 01. පොදු පරිපාලනය

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතෙන් පැවරී ඇති බලතල පරිදි ගනු ලබන ප්‍රතිපත්ති හා තිරණ ක්‍රියාත්මක කිරීමේදී එම කටයුතු අප්‍රමාදව හා අනලස්ව ඉටුකරන බවට තහවුරු කිරීමත් අපේක්ෂා කරනු ලබයි. මෙම අපේක්ෂාවන් මුදුන්පත් කර ගැනීම සඳහා පහත පරිදි කටයුතු කරනු ලබයි.

1. සභාපති හා සභිකයන්ගේ පාලන කටයුතු නිවැරදිව කරගෙන යාම සඳහා ලේකම් සේවාව පවත්වා ගෙන යාම.
2. සභාවේ රැස්වීම් පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම හා සභා වාර්තා පවත්වාගෙන යාම.
3. සභාවේ ලිපිගොනු, වාර්තා හා වෙනත් ලිපි ලේඛන සුරක්ෂිතව තබා ගැනීම හා ලේඛණාගාරය පවත්වා ගෙන යාම.
4. සේවක මණ්ඩලය පාලනය, විශ්‍රාම වැටුප් හා අනෙකුත් පාලන කටයුතු
5. සභාවේ සියළුම පරිපාලනමය හා විධායක කාර් යයන් නියම කිරීම විධිමත් කිරීම.
6. සභාවේ සැම අංශයක්ම ඒකාබද්ධ කිරීමේ ඒකකයක් වශයෙන් පවත්වා ගෙන යාම.
7. සභාවේ දේපලවල ආරක්ෂාව හා භාරකාරිත්වය නිසැක කිරීමට කටයුතු කිරීම.

### 02. මූල්‍ය කටයුතු

මෙම අංශයේ ප්‍රධාන පරමාර්ථය නම් මූල්‍ය පාලනයයි. සභාවේ සියළුම මූල්‍ය කටයුතු ඉටුකිරීම, පාලනය කිරීම හා ඒකාබද්ධ කිරීම ප්‍රධානතම කාර්යය වේ. සභාවේ භාවිතය සඳහා අවශ්‍ය භාණ්ඩ වෙනුවෙන් තොග ගබඩා අවශ්‍ය වන්නේ නම්, ඒවා පවත්වාගෙන යාමේ හා පාලනය කිරීම ආදී කටයුතු ඉටුකිරීම කරනු ලබයි. මේ යටතේ සිදුවන සේවාවන් මෙසේ විග්‍රහ කළ හැකිය.

1. අයවැය ලේඛනය පිළියෙළ කිරීම, ක්‍රියාත්මක කිරීම, ගිණුම් තැබීම හා ගිණුම් වාර්තා සැපයීම.

2. ආදායම් ප්‍රතිපත්ති හා මුදල් සැපයුම් පරිපාලනය කිරීම.
3. ප්‍රාදේශීය සභා අරමුදල් පාලනය කිරීම.
4. ආදායම් හා වෙනත් ලැබීම් පිළිබඳ මධ්‍යගත පාලනය
5. ගිණුම් ගත කිරීමේ ක්‍රම, කාර්යය සංවිධානය හා පාලන ක්‍රම ගිණුම් පොත් පවත්වාගෙන යාම හා ගිණුම් ප්‍රකාශන පිළියෙල කිරීම
6. බඩුබාහිරාදිය මිළදී ගැනීම, එහි භාරකාරිත්වය, ගෙවීම, බෙදා හැරීම පිළිබඳ මධ්‍යගත පාලනය, කාර්යය මණ්ඩල වැටුප් හා පාරිශ්‍රමික දීමනා පිළියෙල කිරීම හා ගෙවීම් කිරීම.

## 03. තක්සේරු කිරීම හා ආදායම් එකතු කිරීම

මෙම අංශයට අයත් කාර්යය නම්, නීතිමය විධිවිධාන අනුව ප්‍රාදේශීය සභා ආදායම් තක්සේරු කිරීම අප්‍රමාදව හා ක්‍රමවත්ව එකතු කර ගැනීම සඳහා ගන්නා වූ සෑම පියවරක් ම ගැනීමට ක්‍රියා කිරීමයි. ඒ පිළිබඳ ලිපි ලේඛන පවත්වා ගැනීම හා සභාවට නව ආදායම් උත්පාදනය කර ගන්නා ආකාරය සොයා බැලීම හා ඒ සඳහා අවශ්‍ය නීති සම්පාදනය කිරීම වෙනුවෙන් ක්‍රියාකිරීමයි.

## 04. අභ්‍යන්තර විගණනය

මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් නම් බදු ගෙවන්නන් සහ සභාව වෙනුවෙන් පරිපාලනයේ සෑම අංශයක්ම පිරික්සීම හා විමර්ශණයට භාජනය කිරීමයි. පහත සඳහන් කාර්යයන් මෙහි ප්‍රධාන කොට සැළකිය හැකිය.

1. ප්‍රාදේශීය සභාවේ අරමුදලට ලැබිය යුතු මුදල් නිසියාකාරව අයකරගනු ලබන බව සොයා බැලීම.
2. වැරදි සහ වංචනික ක්‍රියා වැළැක්වීම සඳහා සියළුම ගිණුම් ඒකකයන් සම්බන්ධයෙන් කරනු ලබන අභ්‍යන්තර ගිණුම් විගණනය සාර්ථක ලෙස කිරීම.
3. භාණ්ඩ පරිහරණය සහ කම්කරු ශ්‍රමය හරිහැටි උපයෝගීකර ගන්නේදැයි සොයා බැලීම.
4. නිදැල්ලේ ඇති සභාවේ වත්කම් නොපමාව විධිමත් භාරකාරිත්වය යටතට ගැනීම හා අපතේ යන කම්කරු ශ්‍රමය හා ද්‍රව්‍ය නාස්තිය වැළැක්වීමට කටයුතු කිරීම.

## 05. කාර්ය මණ්ඩල පුහුණු කිරීම

උසස්ම නිළධාරියාගේ සිට පහළම කම්කරුවා දක්වා සේවය කරනු ලබන සියළුම සේවකයින්ට තම කාර්යය කෙසේ කළ යුතුද යන්න පිළිබඳ හා කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීමේ අදහසින් සේවක පුහුණු ඇති කිරීම මෙහි අරමුණයි.

## සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා යටතේ ඇස්තමේන්තු කර ඇති ආදායම් ප්‍රභවයන් මෙසේය.

➢ **වරිපනම් බදු 1:11**

ප්‍රාදේශිය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුළ වරිපනම් බදු අයකරනු ලබයි. 2025 වර්ෂයට සභා බල ප්‍රදේශය ඇතුලත දියුණු ගම් ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශ වල සංවර්ධන මට්ටම සැලකිල්ලට ගෙන එම ප්‍රදේශ වල පිහිටි නිශ්චල දේපලක හෝ නිශ්චල දේපල වර්ගයක වාර්ෂික වටිනාකම මත පහත සඳහන් පරිදි බදු නියම කර ඇත.

1. රුවන්වැල්ල නගර සභා බල ප්‍රදේශයේ අංක 01 සිට 07 දක්වා වන කොට්ඨාසවල පිහිටි සෑම නිශ්චල දේපලක් මත 7% ක වරිපනම් බද්දක්ද,
2. දියුණු ගම් ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති ගලපිටමඩ , ගෝණගල්දෙනිය, අම්තිරිගල, කන්නත්තොට පිහිටි සෑම නිශ්චල දේපලක් මත 4% ක වරිපනම් බද්දක්ද,

2025 වර්ෂය තුල අයකිරීමට අපේක්ෂිතය. ඒ අනුව 2025 වර්ෂයේ අයකිරීමට අපේක්ෂිත බදු ආදායම රු.5,067,360.00 කි.

➢ **අක්කර බදු 1:12**

ප්‍රාදේශිය සභා පනතේ 134.3 වන උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශ තුල පිහිටියා වූ ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ ද එක් එක් ඉඩම් හෙක්ටයාරයක් මත පහත දක්වා ඇති අනුප්‍රමාණ නොඉක්මවන අක්කර බද්දක් අයකිරීම සඳහා වන ප්‍රතිපාදන සැලසී ඇත.

අ. ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර එකකට නොඅඩු එහෙත් හෙක්ටයාර 5 කට අඩු සෑම ඉඩමක් මත රු. 50/= ක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක්ද,

ආ. හෙක්ටයාර 5හෝ ඊට වැඩිවන සෑම ඉඩමක් සඳහාම එකී ඉඩමේ සෑම හෙක්ටයාරක් මත රු. 10/= බැගින් වන වාර්ෂික අක්කර බද්දක්ද,

2025 වර්ෂයට අයකිරීමට නියමිත අතර, ඒ වෙනුවෙන් 2025 වර්ෂයේ ඇස්තමේන්තුගත කර ඇති අක්කර බදු ආදායම රු.55,000.00 කි.

➢ **වාහන හා සත්ව බදු 1:35**

ප්‍රාදේශිය සභා පනතේ 147 හා 148 වන වගන්ති හා 4 වන උප ලේඛනයේ විධිවිධාන මගින් ප්‍රාදේශිය සභාව වෙත වාහන හා සතුන් පිළිබඳ බද්දක් අයකිරීමට ප්‍රතිපාදන සලසා ඇත. එහි 4 වන උපලේඛනයෙන් අයකල යුතු බදු ප්‍රමාණයන් නියම කර ඇත. ඒඅනුවමෙම විෂය යටතේ රු. 50/= ක මුදලක් 2025 වර්ෂය සඳහා ඇස්තමේන්තු ගත කර ඇත.

## ➢ ප්‍රචාරක දැන්වීම්, බිත්ති දැන්වීම්, කටවුට්, පොස්ටර් සඳහා ගාස්තු 1:37

ප්‍රාදේශීය සභා පනතේ 122.1 වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලය ප්‍රාදේශීය සභාව වෙත ලැබී ඇත. ඒ අනුව ප්‍රචාරක දැන්වීම්, බිත්ති දැන්වීම්. කටවුඩ් හා පෝස්ටර් ආදියෙන් ගාස්තුවක් අයකිරීමට සභාව විසින් ඊට අදාල අතුරු ව්‍යවස්ථා මගින් ප්‍රතිපාදන සලසා ගෙන ඇත. ඒ අනුව අයකරනු ලබන ගාස්තු ප්‍රමාණයන් පහත පරිදි වේ.

1. බිත්තියක හෝ පුවරුවක හෝ ලෑල්ලක හෝ ලී හෝ ගැල්වනයිස් බට යොදා හෝ කොන්ක්‍රීට් කණු යොදා සවිකරනු ලබන ස්ථිර ප්‍රචාරක දැන්වීම් පුවරුවක් සඳහා වර්ග අඩියකට වර්ෂයකට රු. 100/= ක්ද,
2. රෙදි මත පින්තාරු කරන ලද හෝ ඩිජිටල් මුද්‍රණ මගින් සකසන ලද වෙනත් ඕනෑම බැනරයක් ප්‍රදර්ශණය කිරීම වෙනුවෙන් සෑම වර්ග අඩියක් සඳහා මාසයක් හෝ ඉන් කොටසක් සඳහා රු. 50/= ක්ද,නගර සංවර්ධන කටයුතු වලදී දැන්වීම් පුවරු විශාල ප්‍රමාණයක් ඉවත් වූ අතර, දැනට

පවත්නා දැන්වීම් පුවරු හා අලුතින් ඉදිවේ යැයි අපේක්ෂා කරන ප්‍රමාණය පදනම් කරගෙන ඉහත ගාස්තු ප්‍රමාණයන් අනුව 2025 වර්ෂය සඳහා මෙමගින් අපේක්ෂිත ආදායම රු.200,000.00 කි.

## ➢ ලියාපදිංචි කිරීමේ සහතික හා පරීක්ෂණ ගාස්තු 1:41

සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේදී අයකරනු ලබන ලියාපදිංචි ගාස්තු, වරිපනම් උධෘත නිකුත් කිරීමේදී අයකරන ගාස්තුද ඇතුළුව සභාව විසින් සපයනු ලබන විවිධ සේවාවන් වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු මෙම ආදායම් විෂය යටතේ ගැනේ. ඒ අනුව 2025 වර්ෂයට අපේක්ෂිත ආදායම රු.100.000.00 ක මුදලකි.

## ➢ පරිපාලන වියදම් ලැබීම්, හා ඡායා පිටපත් වෙනුවෙන් ගාස්තු 1:43

කර්මාන්ත කටයුතු සිදුකිරීම වෙනුවෙන් හා වෙළඳ බලපත්‍ර සම්බන්ධ නඩුකර වලදී ප්‍රාදේශීය සභාව වෙත ලබාදෙනු ලබන පරිපාලන වියදම් ලැබීම් හා ආයතනයෙන් පරිබාහිර පුද්ගලයන්ගේ අවශ්‍යතාව මත සිදුකරනු ලබන ලිපිලේඛන ඡායාපිටපත් කරදීම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු වශයෙන් 2025 වර්ෂයට සඳහා. රු.50,000.00 ක මුදලක් ඇස්තමේන්තු ගත කර ඇත.

## ➢ වරිපනම් වරෙන්තු ගාස්තු 1:51(1)

වරිපනම් සඳහා ප්‍රවර්ථන වර්ෂය තුල කාර්තුවකට අදාල ගාස්තු නියමිත කාලය තුල ගෙවීමට නොහැකි වූ විට ප්‍රමාද ගාස්තු අයකිරීමක් ලෙස අදාල කාර්තුව සඳහා ගෙවිය යුතු මුදලින් 15% ක් නේවාසික ස්ථාන සඳහාත්, 20% ව්‍යාපාරික ස්ථාන සඳහාත් අයකිරීමට කටයුතු කරනු ලබයි. එසේ අයකරනු

ලබන මුදල මෙම ආදායම් ශීර්ෂය යටතේ දක්වනු ලබන අතර, 2025 වර්ෂය සඳහා රු.120,000.00 ක මුදලක් ඇස්තමේන්තු කර ඇත.

➢ අක්කර බදු වරෙන්තු ගාස්තු 1:51(2)

අක්කර බදු සඳහා කාර්තුවකට අදාළ ගාස්තු නියමිත කාලය තුළ ගෙවීමට නොහැකි වූ විට ප්‍රමාද ගාස්තු ලෙස අදාල කාර්තු සඳහා බදු මුදලින් 10% ක දඩ මුදල් අය කරනු ලබයි. එසේ අය කරනු ලබන ආදායම මෙම ආදායම් ශීර්ෂය යටතේ දක්වනු ලබන අතර, 2025
වර්ෂය සඳහා රු. 120.00 ක මුදලක් ඇස්තමේන්තුගත කර ඇත.

➢ උසාවි දඩ 1:52

ප්‍රාදේශීය සභා පනත මෙන්ම වෙනත් අනපනත් ක්‍රියාත්මක කිරීමේදී නීතිය ක්‍රියාත්මක වීම තුලින් උසාවිය විසින් අයකර ගන්නා වූ දඩ මුදල් වලින් ප්‍රාදේශීය සභාව වෙත ලැබේ යැයි අපේක්ෂිත ආදායම උසාවි දඩ යටතේ ඇස්තමේන්තුගත කර ඇත. පසුගිය වර්ෂයන්හි ලැබී ඇති උසාවි දඩ ආදායම්ද සලකා බලමින් 2025 වර්ෂය සඳහා ඒ වෙනුවෙන් රු.11,248,000.00ක මුදලක් ඇස්තමේන්තු කර ඇත.

➢ ආයෝජන පොලී 1:61

ස්ථාවර තැන්පත් සඳහා අපේක්ෂිත පොලී ආදායම මේ යටතේ ඇස්තමේන්තු ගත කර ඇත. රුවන්වැල්ල ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පවත්වාගෙන යනු ලබන රු. (ලක්ෂ10) 1,000,000.00 ක මුදල සඳහා 14% ක පොලිය යටතේ ද, රුවන්වැල්ල මහජන බැංකුවේ රුපියල් (කෝටි 1.5) 15,000,000.00 ක මුදලක් 14.75% ක පොලියක් යටතේ ද, රු.5,000,000.00 ක මුදලක් 15%ක් බැගින් වූ පොලියකට ද, තවත් (කෝටි 2) රු.20,000,000.00ක මුදලක් රුවන්වැල්ල මහජන බැංකුවේ 17%ක පොලී අනුපාතිකයක් යටතේ තැන්පත් කර ඇත. ඉන් 2025 වසර සඳහා අපේක්ෂිත ආදායම් රු.7,500,000.00කි.

➢ විකිණීම් 1:62

වැඩසටහන් අංක 01 යටතේ වන ආකෘති හා පෝරම ආදිය විකිණීමෙන් ලැබෙන ආදායම හා අබලි ද්‍රව්‍ය විකිණීමෙන් ලැබෙන ආදායම් ද ඇතුළු ව 2025 වර්ෂය සඳහා රු.1,000,000.00 ක මුදලක් මේ යටතේ ඇස්තමේන්තු කර ඇත. 2025 වර්ෂය සඳහා ආකෘති හා පෝරම විකිණීමේදී අය කරනු ලබන ගාස්තු ප්‍රමාණයන් පහත පරිදි වේ.

1. පාපැදි බලපත්‍ර සඳහා අයදුම් පත්‍ර ගාස්තුව රු.16.00
2. අනතුරුදායක ගස් ඉවත්කිරීමේ ඉල්ලුම් පත්‍ර ගාස්තුව
   - කොස් ගස් හා බලපත්‍ර ලබා ගත යුතු අනෙකුත් ගස් සඳහා රු.2000.00
   - ඉහත වර්ගයට අයත් නොවන ගස් සඳහා රු.1000.00
3. වරිපනම් ලේඛනයේ නම වෙනස්කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව රු.200.00

## ➢ ක්‍රියාත්මක ආදායම 1:64

ප්‍රාදේශීය සභා සේවකයින් වෙනුවෙන් ලබා දී ඇති සේවක ණය වෙනුවෙන් අය කරනු ලබන පොළිය ආදායමක් ලෙස හා ප්‍රාදේශීය සභාව විසින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් ලැබෙන ආදායම ද ඇතුළුව 2025 වර්ෂය සඳහා ක්‍රියාත්මක ආදායම් ලෙස රු.500.000.00 ක මුදලක ඇස්තමේන්තු කර ඇත.

## ➢ මුද්දර ගාස්තු 1:65

ප්‍රදේශයේ සංවර්ධනය සමගම සිදුවන ඉඩම් ගනුදෙනු වලදී ඔප්පු වටිනාකම් සඳහා ලබාගන්නා මුද්දර ගාස්තුව වශයෙන් 2025 වර්ෂයේ දී අපේක්ෂිත ආදායම රු. 13,700,000.00 කි.

## ➢ වැටුප් ප්‍රතිපූරණය 1:71

ස්ථිර කාර්ය මණ්ඩලයේ සේවකයින් 59 දෙනෙකු වෙනුවෙන් වැටුප් ප්‍රතිපූරණය වශයෙන් අපේක්ෂිත වැටුප් ආධාර මුදල රු.42,466,440.00 කි
ගරු සභාපතිතුමා, ගරු උපසභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් මන්ත්‍රී දීමනා ප්‍රතිපූර්ණය වශයෙන් අපේක්ෂිත මුදල රු.5,580,000.00 කි.

## ➢ පරිත්‍යාග 1:71(2)

වෙනත් ආයතනවලින් ලැබෙන පරිත්‍යාග,ආධාර හා ත්‍යාග මෙම ශීර්ෂය යටතේ ගිණුම්ගත කරනු ලැබේ.

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

ආදායම් ඇස්තමේන්තුව - 2025

1. පොදු පරිපාලනය

| වැඩ සටහන | ශීර්ෂය | 2022 සත්‍ය ආදායම (රු) | 2023 සත්‍ය ආදායම (රු) | 2024.09.30 ට සත්‍ය ලැබීම් (රු.) | 2024 ඇස්තමේන්තුව | 2025 ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|---|
| 10. වරිපනම් හා බදු | | | | | | |
| වරිපනම් බදු | 1.11 | 3,385,492.36 | 6,688,394.31 | 2,965,835.18 | 5,067,360.00 | 5,067,360.00 |
| අක්කර බදු | 1.12 | 53,652.30 | 70,439.00 | 29,736.49 | 55,000.00 | 55,000.00 |
| එකතුව | | **3,439,144.66** | **6,758,833.31** | **2,995,571.67** | **5,122,360.00** | **5,122,360.00** |
| බලපත්‍ර ගාස්තු | | | | | | |
| වාහන හා සත්ව බදු | 1.35 | | 104.00 | - | 248.00 | 250.00 |
| දැන්වීම් පුවරු ගාස්තු (ප්‍රචාරක දැන්වීම්, බිත්ති දැන්වීම්, අහස් දැන්වීම් ආදිය | 1.37 | 141,725.00 | 214,925.00 | 114,750.00 | 175,000.00 | 200,000.00 |
| එකතුව | | **141,725.00** | **215,029.00** | **114,750.00** | **175,248.00** | **200,250.00** |
| 40 සේවා සඳහා ගාස්තු | | | | | | |
| ලියාපදිංචි කිරීමේ සහතික හා පරීක්ෂණ ගාස්තු (සැපයුම්කරුවන් ලි.ප.ගා. වරිපනම් උධෘත නිකුත් කිරීමේ ගාස්තුද ඇතුළුව) | 1.41 | 88,000.00 | 119,000.00 | 8,000.00 | 78,000.00 | 100,000.00 |
| පරිපාලන වියදම් ලැබීම් හා ඡායා පිටපත් වෙනුවෙන් ගාස්තු | 1.43 | 22,908.00 | 20,750.00 | 8,875.00 | 50,000.00 | 50,000.00 |
| එකතුව | | **110,908.00** | **139,750.00** | **16,875.00** | **128,000.00** | **150,000.00** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 50 වරෙන්තු හා දඩ | | | | | | |
| වරෙන්තු ගාස්තු (වරිපනම්) | 1.51 (1) | 123,131.77 | 112,970.91 | 105,190.38 | 100,000.00 | 120,000.00 |
| වරෙන්තු ගාස්තු (අක්කර බදු) | 1.51 (2) | 460.81 | 11.25 | - | 120.00 | 120.00 |
| දඩ (උසාවි දඩ) | 1.52 | 5,769,505.00 | | - | 10,000,000.00 | 11,248,000.00 |
| එකතුව | | **5,893,097.58** | **112,982.16** | **105,190.38** | **10,100,120.00** | **11,368,120.00** |
| 60 වෙනත් ආදායම් | | | | | | |
| ආයෝජන පොලී | 1.61 | 1,984,473.27 | 6,860,097.25 | 3,810,358.88 | 7,500,000.00 | 7,000,000.00 |
| විකිණීම් (මුද්‍රිත පෝරම, අබලි ද්‍රව්‍ය විකිණීම) | 1.62 | 178,475.00 | 893,984.00 | 319,632.89 | 300,000.00 | 1,000,000.00 |
| ක්‍රියාත්මක ආදායම් (සේවක ණය පොලී) | 1.64 | 458,501.80 | 542,534.82 | 416,245.03 | 500,000.00 | 500,000.00 |
| මුද්දර ගාස්තු | 1.65 | 9,251,382.98 | 11,598,404.00 | 7,439,604.00 | 15,000,000.00 | 13,700,000.00 |
| එකතුව | | **11,872,833.05** | **19,895,020.07** | **11,985,840.80** | **23,300,000.00** | **22,200,000.00** |
| 70 ආදායම් ආධාර | | | | | | |
| වැටුප් ප්‍රතිපූර්ණ | 1.71 | 2,782,742,089.00 | 32,600,757.86 | 25,849,634.44 | 43,847,280.00 | 42,466,440.00 |
| මන්ත්‍රී දීමනා | 1.71(1) | 5,518,387.09 | 1,689,500.00 | 346,666.67 | 5,580,000.00 | 5,580,000.00 |
| පරිත්‍යාග/ආධාර/ත්‍යාග ආදිය | 1.71(2) | | | | | 10,000.00 |
| එකතුව | | **2,788,260,476.09** | **34,290,257.86** | **26,196,301.11** | **49,427,280.00** | **48,056,440.00** |
| ආදායම් සාරාංශය | | | | | | |
| ප්‍රාග්ධන ආදායම් | | | | | | |
| පුනරාවර්තන ආදායම් | | **2,809,718,184.38** | **61,411,872.40** | **41,414,528.96** | **88,253,008.00** | **87,097,170.00** |
| මුළු එකතුව | | **2,809,718,184.38** | **61,411,872.40** | **41,414,528.96** | **88,253,008.00** | **87,097,170.00** |

## වියදම් ඇස්තමේන්තුව - 2025

### 1.පොදු පරිපාලනය

| වැඩ සටහන | ශීර්ෂය | උප ශීර්ෂ | 2022 සත්‍ය වියදම (රු.) | 2023 සත්‍ය වියදම (රු) | 2024.09.30 ට සත්‍ය වියදම (රු.) | 2024 ඇස්තමේන්තුව | 2025 ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|---|---|
| **01.**වැටුප් හා දීමනා | 101 | | | | | | |
| වැටුප් හා වේතන (ස්ථිර) | | 101 | 28,823,019.95 | 32,645,500.40 | 26,042,655.53 | 43,847,280.00 | 41,779,680.00 |
| වැටුප් හා වේතන (අනියම්) | | 101(1) | 350,555.09 | 372,444.36 | 304,125.94 | 594,600.00 | 594,600.00 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | | 101(2) | 618,158.00 | 925,312.41 | 495,728.21 | 800,000.00 | 750,000.00 |
| මන්ත්‍රී දීමනා | | 101(4) | 5,518,387.09 | 1,411,166.67 | 160,000.00 | 5,580,000.00 | 5,580,000.00 |
| වෙනත් දීමනා (පුහුණු අභ්‍යාසලාභීන් හතර දෙනෙකු සඳහා බටා ගාස්තු, කේ. පෝරම හා ආදායම් ලේඛන ලිවීමේ ගාස්තු) | | 101(9) | 165,348.00 | 229,620.00 | 116,220.00 | 200,000.00 | 250,000.00 |
| පෞද්ගලික ලේකම් දීමනා | | 101(9)1 | 60,000.00 | - | - | 180,000.00 | 180,000.00 |
| එකතුව | | | **35,535,468.13** | **35,584,043.84** | **27,118,729.68** | **51,201,880.00** | **49,134,280.00** |
| **02.**ගමන් වියදම් | 102 | | | | | | |
| ගමන් වියදම් (කා.ම. නොවන) | | 102(1) | 131,610.25 | 13,000.00 | | 200,000.00 | 200,000.00 |
| ගමන් වියදම් (කා.ම.) | | 102(2)1 | 374,924.00 | 878,040.00 | 487,861.18 | 600,000.00 | 600,000.00 |
| ගමන් වියදම් ( විදේශීය) | | 102(3) | 50,000.00 | - | | 50,000.00 | 50,000.00 |
| එකතුව | | | **556,534.25** | **891,040.00** | **487,861.18** | **850,000.00** | **850,000.00** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **03** සැපයුම් හා උපකරණ | 103 | | | | | | |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය උපකරණ | | 103(1) | 2,093,584.12 | 2,116,983.50 | 843,768.96 | 2,000,000.00 | 1,500,000.00 |
| ඉන්ධන හා ලිහිසි තෙල් (කා.ම.) | | 103(2)1 | 2,429,000.00 | 3,499,720.00 | 2,613,630.52 | 2,500,000.00 | 1,500,000.00 |
| ඉන්ධන දීමනාව ( ගරු උපසභාපතිතුමා, ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලය) | | 103(2)2 | 1,569,193.55 | 381,833.33 | | 500,000.00 | 1,740,000.00 |
| ඉන්ධන හා ලිහිසි තෙල් (ගරු සභාපතිතුමා සඳහා) | | 103(2)3 | | | | | 2,000,000.00 |
| ආහාර (සංග්‍රහ වියදම්) මාසික සභාව | | 103(5) | 135,000.00 | 38,171.24 | | 50,000.00 | 100,000.00 |
| ආහාර (සංග්‍රහ වියදම්) විශේෂ සභාවාර | | 103(6) | 59,043.57 | 178,632.00 | | 15,000.00 | 100,000.00 |
| නිල ඇඳුම් සැපයීම | | 103(7) | 81,000.00 | 111,030.00 | 117,688.00 | 150,000.00 | 150,000.00 |
| සංග්‍රහ වියදම් (කාර්යාල) | | 103 (8) | - | - | 55,406.00 | 150,000.00 | 150,000.00 |
| ඵලදායිතා සහ කාර්ය සාධන තරඟ සඳහා අවශ්‍ය වියදම් දැරීම | | 103(9) | | 14,042.00 | 33,000.00 | 50,000.00 | 50,000.00 |
| එකතුව | | | **6,366,821.24** | **6,340,412.07** | **3,663,493.48** | **5,415,000.00** | **7,290,000.00** |
| **04** ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව | 104 | | | | | | |
| වාහන යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියාව | | 104(1) | 1,513,998.26 | 1,795,270.00 | 2,201,665.64 | 2,000,000.00 | 2,000,000.00 |
| උපකරණ අළුත්වැඩියාව | | 104(2) | 270,177.98 | 199,370.02 | 485,753.01 | 300,000.00 | 500,000.00 |
| සභාව සතු වත්කම් නිරවුල් කිරීම | | 104(2)2 | | | | | 500,000.00 |
| ගොඩනැගිලි අළුත්වැඩියාව | | 104(3) | | 30,019.00 | 2,850.00 | 800,000.00 | 800,000.00 |
| එකතුව | | | **1,784,176.24** | **2,024,659.02** | **2,690,268.65** | **3,100,000.00** | **3,800,000.00** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 05 ප්‍රවාහන සම්බන්ධතා හා අවශ්‍යතා සේවා | 105 | | | | | | |
| ප්‍රවාහනය | | 105(1) | | 900.00 | | 10,000.00 | 10,000.00 |
| සම්බන්ධතා සේවා (දූරකතන) (කාර්යාල) | | 105(2)1 | 118,851.51 | 125,437.18 | 139,383.27 | 150,000.00 | 250,000.00 |
| දූරකථන සම්බන්ධතා සේවා (මන්ත්‍රී දූරකථන දීමනා) | | 105(2)2 | 1,011,000.00 | 244,900.00 | 10,000.00 | 200,000.00 | 1,116,000.00 |
| විදුලිය බිල්පත් ගෙවීම | | 105(3)1 | 246,594.67 | 409,191.45 | 273,493.97 | 550,000.00 | 550,000.00 |
| ජල බිල්පත් ගෙවීම | | 105(3)2 | 57,200.98 | 80,189.20 | 73,557.48 | 150,000.00 | 175,000.00 |
| සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා | | 105(6) | 4,917.00 | 2,800.00 | - | 50,000.00 | 50,000.00 |
| මුද්‍රණ සේවා | | 105(8) | 192,591.98 | 380,843.21 | 217,622.34 | 400,000.00 | 400,000.00 |
| වෙනත් දෙපාර්තමේන්තු / ආයතනවලට ගෙවීම් (නීතිඥ ගාස්තු, භාෂා පරිවර්තන ගාස්තු) | | 105(9)1 | 360,000.00 | 361,634.55 | 429,402.22 | 500,000.00 | 500,000.00 |
| විගණන ගාස්තු | | 105(9)2 | 319,200.00 | 365,010.00 | 363,912.00 | 425,000.00 | 650,000.00 |
| සභා වාහන රක්ෂණ සහ ආදායම් බලපත්‍ර | | 105(9)4 | 263,312.63 | 293,278.40 | 285,390.60 | 350,000.00 | 300,000.00 |
| මුද්දර ගාස්තු (තැපැල් මුද්‍රා යන්ත්‍රය) | | 105(9)5 | 150,000.00 | 265,380.00 | 180,410.00 | 300,000.00 | 300,000.00 |
| පුවත්පත් දැන්වීම් සඳහා | | 105(9)7 | 200,730.75 | 180,502.03 | - | 200,000.00 | 200,000.00 |
| මාර්ගස්ථ මුදල් හා කාර්යාලීය ගොඩනැගිලි හා උපකරණ රක්ෂණය | | 105(9)8 | 56,214.74 | 73,658.81 | 75,275.90 | 100,000.00 | 100,000.00 |
| කාර්ය මණ්ඩලය, මහජන නියෝජිතයින් සඳහා පුහුණු පාඨමාලා | | 105(9)8(1) | 55,000.00 | - | 9,000.00 | 100,000.00 | 300,000.00 |
| කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා | | 105(9)9 | | 91,990.00 | 70,275.50 | 100,000.00 | 300,000.00 |
| වරිපනම් කලාපය පුළුල් කිරීම සඳහා අවශ්‍ය වියදම් දැරීම සඳහා | | 105(9)9(1) | - | | | 10,000.00 | 100,000.00 |
| එකතුව | | | **3,035,614.26** | **2,875,714.83** | **2,127,723.28** | **3,595,000.00** | **5,301,000.00** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 07 ආධාර මුදල් ,දායක මුදල් , සහනාධාර හා ත්‍යාග ආදිය | 107 | | | | | | |
| ආධාර මුදල් ,දායක මුදල් , සහනාධාර හා ත්‍යාග ආදිය | | 107(1) | | | | | 15,000.00 |
| සුබ සාධක ගෙවීම් (නිදහස් දුම්රිය බලපත්‍ර සඳහා) | | 107(2) | 128,700.00 | 152,100.00 | 28,675.00 | 300,000.00 | 300,000.00 |
| එකතුව | | | **128,700.00** | **152,100.00** | **28,675.00** | **300,000.00** | **315,000.00** |
| 08 විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික | 108 | | | | | | |
| වෙනත් (විශ්‍රාම වැටුප්) (රා.සේ.අ.අ.) (සේ.නි.හා.අ.) | | 108(8) | 41,869.10 | 44,459.04 | 32,587.94 | 91,440.00 | 146,690.00 |
| එකතුව | | | **41,869.10** | **44,459.04** | **32,587.94** | **91,440.00** | **146,690.00** |
| පුනරාවර්ථන වියදම් එකතුව | | | **47,449,183.22** | **47,912,428.80** | **36,149,339.21** | **64,553,320.00** | **66,836,970.00** |
| 09 ප්‍රාග්ධන වැය | 109 | | | | | | |
| උපකරණ (Mic, විදුලි පංකා, වානේ අල්මාරි, පරිගණක) | | 109(1) | - | 40,965.00 | 79,060.00 | 1,500,000.00 | 100,000.00 |
| තොරතුරු තාක්ෂණික අවශ්‍යතා | | 109(2) | | | | | 350,000.00 |
| එකතුව | | | - | **40,965.00** | **79,060.00** | **1,500,000.00** | **450,000.00** |
| වියදම් සාරාංශය | | | | | | | |
| පුනරාවර්ථන වියදම් | | | 47,449,183.22 | 47,912,428.80 | 36,149,339.21 | 64,553,320.00 | 66,836,970.00 |
| ප්‍රාග්ධන වියදම් | | | - | 40,965.00 | 79,060.00 | 1,500,000.00 | 450,000.00 |
| මුළු එකතුව | | | **47,449,183.22** | **47,953,393.80** | **36,228,399.21** | **66,053,320.00** | **67,286,970.00** |

# සෞඛ්‍ය සේවා



## වැඩ සටහන් අංක 02

### සෞඛ්‍ය සේවා

මෙම වැඩසටහනට අයත් කාර් යයන් පහත සඳහන් ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක වනු ලබයි.

01. රෝග වැළැක්වීමේ සේවාව
02. රෝග සුව කිරීමේ සේවාව
03. ආහාර හා සනීපාරක්ෂාව
04. මළ අපද්‍රව්‍ය බැහැර කිරීමේ සේවාව
05. සෞඛ්‍ය අධ්‍යාපනය
06. ඝණ අපද්‍රව්‍ය එකතු කිරීම හා විනාශ කිරීම
07. වෙනත් සෞඛ්‍ය සේවා, ආදාහනාගාර, සුසාන භූමි ඇතුළුව
08. මාතෘ හා ළමා සායන
09. ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන පවත්වා ගෙන යාම.
10. පරිසර කළමණාකරණය හා සංරක්ෂිත වැඩසටහන් පවත්වා ගෙන යාම.

### 01. රෝග වැළැක්වීමේ සේවාව

විවිධ ප්‍රචාරක කටයුතු මගින්, වසංගත රෝග, බෝවන රෝග මෙන්ම බෝ නොවන රෝග පිළිබඳව ද, පරිසරයේ හටගන්නා සනීපාරක්ෂාවට අහිතකර තත්වයන් පිළිබඳව දැනුවත් කිරීම ද, පරිසරයේ හටගන්නා සනීපාරක්ෂාවට අහිතකර තත්වයන් නැති කිරීමට කටයුතු කිරීම හා සෞඛ්‍ය වර්ධනය ඇති කිරීම මෙම සේවාවට අයත් වේ.

1. ලෙඩ රෝග වැළැක්වීම සඳහා නීති රීති ක්‍රියාත්මක කිරීම.
2. වෙළඳ ව්‍යාපාරික ස්ථාන ආදිය විධිමත් කිරීම හා විමධ්‍යගත පාලනය.
3. ජල භීතිකා රෝග පාලනය කිරීමට කටයුතු කිරීම.
4. විශබීජ නාශක බෙහෙත් දියර ඉසීම.
5. එන්නත්කරණය හා ප්‍රතිශක්තිකරණය පවත්වා ගෙන යාම.

## 02. රෝග සුවකිරීමේ සේවාව

හොමියෝපති වෛද්‍ය සායන පැවැත්වීමෙන්ද, නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා පිහිටුවා පවත්වාගෙන යාමෙන්ද ලෙඩ රෝග සුව කිරීම සඳහා මහජන සෞඛ්‍ය පුනරුත්තාපනය මෙන්ම මහජන සෞඛ්‍ය වර්ධනය කිරීම ද මෙම සේවාවේ විශේෂ ලක්ෂණය වේ.

## 03. ආහාර හා සනීපාරක්ෂාව

- ආහාර හා ඖෂධ පනත ක්‍රියාත්මක කිරීම
- ආහාර පිළිබඳ සෞඛ්‍ය කටයුතු සඳහා හෝටල්, තේ කඩ, බත් කඩ, බේකරි සහ අප්‍රිය හා අනතුරුදායක යටතට ගැනෙන ස්ථාන සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීම.
- ගෝ ඝාතක ආඥාපනත ක්‍රියාත්මක කිරීම

## 04. මළ අපද්‍රව්‍ය බැහැර කිරීමේ සේවාව

- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙන්ම අවට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවලින්ද මළ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ගලි සේවාව පවත්වා ගෙන යාම
- විධිමත් පරිදි මළ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම.
- අඩු ආදායම්ලාභීන් සඳහා සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් සැපයීම සඳහා කටයුතු කිරීම.
- නාගරික බල ප්‍රදේශවල පොදු වැසිකිළි නඩත්තු කර පවත්වා ගෙන යමින් මහජන සේවාව සැපයීම.

## 05. සෞඛ්‍ය අධ්‍යාපනය

පාසල් දරුවන් දැනුවත් කිරීමේ විවිධ සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් (ඩෙංගු මර්ධන, කොවිඩ් මර්ධන වැඩසටහන්) වීඩියෝ දර්ශණ හා සිනමා දර්ශණ උපයෝගී කර ගැනීම මගින් පැවැත්වීම.

## 06. ඝන අපද්‍රව්‍ය එකතු කිරීම හා විනාශ කිරීම

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජනනය වන ඝණ අපද්‍රව්‍ය, දිරන නොදිරන හා විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය දෛනිකව එක්රැස් කිරීම.

- එලෙස එකතුකරන ලද කසල විධිමත් පරිදි බැහැර කිරීම සඳහා වන කසල වර්ගීකරණය කර, දිරායන කොටස් වලින් කාබනික පොහොර නිෂ්පාදනය කිරීම.
- අලෙවිකළ හැකි ද්‍රව්‍ය අලෙවිකර මුදල් උත්පාදනය හා විනාශ කළ හැකි ද්‍රව්‍ය විනාශ කිරීම.

## 07. වෙනත් සෞඛ්‍ය සේවා (අදාහනාගාර හා සුසානභූමි ඇතුළුව)

බල ප්‍රදේශයේ සෞඛ්‍යයට තර්ජනයක් නොවන
පරිදි ප්‍රදේශයේ වැසියන්ගේ හා අනාථ මළසිරුරු මෙන්ම, වසංගත තත්වයන් අවස්ථාවලදී මියයන පුද්ගල මළ සිරුරු ඉක්මණින් භූමදානය කිරීමට හා ආදාහනය කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීම මෙම සේවාවේ අරමුණ වේ.

08. මාතෘ හා ළමා සායන, බෝ වන හා බෝ නොවන රෝග සඳහා සායන පවත්වා ගෙන යාම.

- බල ප්‍රදේශය තුළ ජීවත්වන සියළුම ප්‍රජාව ආවරණය වන පරිදි මව්වරුන් සඳහා ද, ළමුන් සඳහා ද සායන පැවැත්වීම.
- සියළුම වයස් කාණ්ඩ ආවරණය වන පරිදි බෝවන හා බෝ නොවන රෝග සඳහා සායන පවත්වා, උන්නත්කරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

09. ආයුර්වේද මධ්‍යස්ථාන පවත්වා ගෙන යාම.

බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවට දේශීය වෛද්‍ය සේවාව ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් ලබාදීම.

10. පරිසර කළමණාකරණය හා පරිසර සංරක්ෂණ වැඩ සටහන් පවත්වාගෙන යාම.

පරිසරයේ සමබරතාවය ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය පරිසර සංරක්ෂණ වැඩසටහන් මෙන්ම රුක් රෝපණ වැඩසටහන් පවත්වා ගෙන යාමට කටයුතු කිරීම හා අනතුරුදායක ගස් ඉවත් කිරීමට කටයුතු කිරීම.

**<u>සෞඛ්‍ය සේවා වැඩසටහන් යටතේ ඇස්තමේන්තු කර ඇති ආදායම් ප්‍රභවයන් මෙසේය.</u>**

- **කර්මාන්ත බදු, ව්‍යාපාර බදු, වෘත්තීය බදු 2:16**

ප්‍රාදේශීය සභා පනතේ 150(1) වන වගන්ති ප්‍රකාර සභා සීමාව තුල පවත්වා ගෙන යනු ලබන යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් බද්දක් නියම කර අය කිරීම කළ හැකි බවත්, ඒ අනුව එම බද්ද පහත පරිදි අය කළ හැකි බවත් දන්වා ඇත.

එම කර්මාන්ත පවත්වා ගෙන යනු ලබන ස්ථානයේ,

- වාර්ෂික වටිනාකම රු.750.00 ක් නොඉක්මවන අවස්ථාවක එකී ස්ථානයෙන් රු. 500.00 ක බද්දක් ද,
- රු.750.00 ඉක්මවන එහෙත් රු.1,500.00 නොඉක්මවන අවස්ථාවකදී, රු.750.00 ක බද්දක්ද,
- රු.1,500.00 ඉක්මවන අවස්ථාවකදී රු.1,000.00 ක බද්දක්ද, අයකිරීමට පනතේ විධිවිධාන සලසා ඇත.

ප්‍රාදේශීය සභා පනතේ 152(1) සහ 152(2) වගන්තිය ප්‍රකාර යම් වෙළඳ ව්‍යාපාරයක් සභා සීමාව ඇතුළත පවත්වා ගෙන යනු ලබන්නේ නම්, එකී වෙළඳ ව්‍යාපාරයේ බද්ද ගෙවිය යුතු වර්ෂයට පෙර වර්ෂය සඳහා වූ වෙළඳ ව්‍යාපාරයේ ආදායම අනුව පහත සඳහන් අනුප්‍රමාණයන් අනුව අයකර ගැනීමට 2025 වර්ෂයේ දී ඇස්තමේන්තු කර ඇත.

1. වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ආදායම රු.6,000.00 නොඉක්මවන අවස්ථාවක කිසිදු බදු මුදලක් අයකිරීමක් නැත.
2. රු. 6,000.00 ඉක්මවන එහෙත් රු.12,000.00 නොඉක්මවන අවස්ථාවක රු.90.00ක බද්දක්ද,
3. රු. 12,000.00 ඉක්මවන එහෙත් රු.18,750.00 නොඉක්මවන අවස්ථාවක රු.180.00ක බද්දක්ද,
4. රු. 18,750.00 ඉක්මවන එහෙත් රු.75,000.00 නොඉක්මවන අවස්ථාවක රු.360.00ක බද්දක්ද,
5. රු. 75,000.00 ඉක්මවන එහෙත් රු.150,000.00 නොඉක්මවන අවස්ථාවක රු.1200.00ක බද්දක්ද,
6. රු. 150,000.00 ඉක්මවන අවස්ථාවක රු.3,000.00 බද්දක්ද, අය කරනු ලබයි.

මේ යටතේ අයකර ගැනීමට 2025 වර්ෂයේදී අපේක්ෂිත ආදායම රු.800,000.00 කි.

## ➢ වෙළඳ බලපත්‍ර ගාස්තු 2:31

ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාර සහ සාදන ලද අතුරු ව්‍යවස්ථාවල විස්තර කර ඇති ආකාරයට ප්‍රාදේශීය සභාවේ බලපත්‍රයක් එකි ව්‍යාපාර ස්ථාන වෙනුවෙන් ලබාගතයුතු අතර ඒ සඳහා ගාස්තුව පහත සඳහන් පරිදි තීරණය කරනු ලබයි.

**1. බලපත්‍රයක් ලබාගත යුතු ව්‍යාපාර ස්ථානයේ වාර්ෂික වටිනාකම**

**2. ඒ වෙළඳ ව්‍යාපාරයේ පිරිවැටුම**

**3. ඒ වෙළඳ ව්‍යාපාරයෙන් උපයනු ලැබිය හැකි ලාභය**

**4. ඒ වෙළඳ ව්‍යාපාරය මගින් සපයනු ලබන භාණ්ඩ හා සේවාවල අත්‍යාවශ්‍ය ස්වභාවය සැලකිල්ලට ගනිමින් සභාව විසින් ගාස්තු තීරණය කරනු ලබයි. 2025 වර්ෂය වෙනුවෙන් පහත සඳහන් පරිදි ක්‍රියාත්මක කිරීමට නියමිතය.**

- වෙළඳ ව්‍යාපාර ස්ථානයේ වාෂරීක වටිනාකම රු. 750.00 නොඉක්මවන අවස්ථාවක රු. 500.00 ක ගාස්තුවක්ද,
- රු. 750.00 ඉක්මවන එහෙත් රු.1500.00 නොඉක්මවන අවස්ථාවක රු. 750.00 ක ගාස්තුවක්ද,
- රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක රු.1,000.00 ක ගාස්තුවක්ද, වශයෙනි.

මේ අනුව 2025 වර්ෂය සඳහා මෙමගින් ඇස්තමේන්තු ගත කර ඇති ආදායම රු.500,000.00 කි.

## ➢ පාරිසරික බලපත්‍ර ගාස්තු 2:37

පාරිසරික පනත ක්‍රියාත්මක වීම යටතේ අය කරනු ලබන බලපත්‍ර ගාස්තු ආදායම ඇතුළුව 2025 වර්ෂය වෙනුවෙන් රු.170,000.00ක මුදලක් ඇස්තමේන්තු කර ඇත.

පාරිසරික බලපත්‍ර වසර 03 ක් සඳහා රු. 4500.00කි.

## ➢ සේවා සඳහා ගාස්තු 2:43

බල ප්‍රදේශයේ ජනතාවගේ ජල අවශ්‍යතාවන් සපුරනු සඳහා ජල බවුසර සේවාව සපයනු ලබන අතර එම සේවාව සඳහා ගාස්තු පහත සඳහන් පරිදි වේ.

ජල බවුසරය කුලියට දීම.

1. ජල බවුසරය සඳහා (ලීටර් 6000) ජලය රහිතව රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල රු.8000.00ක් ද බල ප්‍රදේශයෙන් ප්‍රදේශයෙන් පිටත යාම සඳහා රු.10000.00ක් ද අය කෙරේ. ඊට

අමතරව ප්‍රවාහන ගාස්තු ලෙස යාමට හා ඒමට එක් කිලෝමීටරයක් සඳහා රු.350.00ක් බැගින් අය කෙරේ. රඳවා තබා තබා ගන්නේනම් රඳවා තබා ගන්නා එක් පැයකට රු.1500.00 බැලින් අයකෙරේ.

## ➢ ගලිසේවාව.

ප්‍රාදේශීය සභාව විසින් බල ප්‍රදේශය තුළ හා ඉන් පිටත සේවාවන් සැලසීම සඳහා දැනට මලාපවාහන පද්ධතියක් ක්‍රියාත්මක වන අතර ඒ සඳහා ගලි බවුසර් සපයනු ලබයි. මෙම සේවාවන් සඳහා අයකරනු ලබන ගාස්තු පහත පරිදි වේ.

ගලිබවුසරය (එක් කාර්යයක් සඳහා )

1. වරිපනම් සීමාව තුළ - රු. 8,500.00
2. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පරිපනම් සීමාවෙන් පිටත හා බල ප්‍රදේශයෙන් පිට - රු. 10,000.00

ඉදල්පොල මලාපවහන පද්ධතියට මුදා හැරීමේ ගාස්තු ලෙස, බල ප්‍රදේශය තුල මුදල් අය නොකෙරේ. බල ප්‍රදේශයෙන් පිටත නම් රු. 2,000.00 ක් ද, රාජ්‍ය ආයතන සඳහා රු.2000.00 රු.2000.00 ක් ද බැගින් අය කෙරේ. රාජ්‍ය නොවන ආයතන සඳහා අය කිරීම රු.2500.00 කි. සේවා ගාස්තු ලෙස රු.1000.00ක් අය කෙරේ. ප්‍රවාහන ගාස්තු වශයෙන් කි.මී. 1 කට යාමට හා ඒමට රු.200.00 බැගින් දුර ප්‍රමාණය අනුව ගාස්තු අය කෙරේ.

මේ අනුව සේවා සඳහා ගාස්තු යටතේ 2025 වර්ෂයට ඇස්තමේන්තු කර ඇති ආදායම රු. 1,300,000.00කි.

## ➢ පොදු වැසිකිලි 2:43(1)

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් සේවා වශයෙන් පවත්වාගෙන යනු ලබන පොදු වැසිකිලි රුවන්වැල්ල හා අඟුරුවැල්ල නගරයේ පවත්වාගෙන යන අතර, මෙම ආදායම් විෂය යටතේ ඇස්තමේන්තු ගත කර ඇති මුදල රු. 150,000.00 කි.

## ➢ ආදාහනාගාරය 2:43 (11)

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන නවත් සේවාවක් ලෙස ආදාහනාගාරය පවත්වාගෙන යන අතර මෙම කායර්ය යටතේ අයකර ගන්නා ගාස්තු පහත පරිදි වේ.

- බල ප්‍රදේශය තුල - රු. 12,000.00

| මූලික ආයෝජන මුදල | ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තු (රු.) |
|---|---|
| 250,000.00 ට අඩු | රු.3000/-+ රජයේ අනුමත බදු |
| 250,001.00 හා 500,000.00 අතර | රු.3750/-+ රජයේ අනුමත බදු |
| 500,001.00 හා 1,000,000.00 අතර | රු.5000/-+ රජයේ අනුමත බදු |
| 1,000,001.00 වැඩි | රු.10,000/-+ රජයේ අනුමත බදු |

- බල ප්‍රදේශයෙන් පිටත - රු. 14,000.00
- භූමිදාන ගාස්තු - රු.200.00

ඒ අනුව මෙම ආදායම් විෂය යටතේ ඇස්තමේන්තු කර ඇති මුදල රු. 3,000,000.00 කි.

## ➢ පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ පරීක්ෂණ ගාස්තු 2:44

පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීම සඳහා ප්‍රථම වරට අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන් හා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර වසර 03 කට වරක් අලුත් කිරීමේදී අදාළ අයදුම්පත නිසි කාලසීමාව තුළ ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගෙන් ආරම්භක ප්‍රාග්ධනය පදනම් කර ගනිමින් පරීක්ෂණ ගාස්තු අය කිරීමක් සිදු කරනු ලබන අතර, 2025 **වර්ෂය** සඳහා රු. 15,000.00 ක මුදලක් ඇස්තමේන්තු කර ඇත.

## ➢ වරෙන්තු ගාස්තු හා දඩ කුලී 2:51

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන පොදු වැසිකිලි සඳහා වරෙන්තු ගාස්තු හා දඩ කුලී ලෙස මෙම ආදායම් විෂය යටතේ 2025 **වර්ෂය** සඳහා ඇස්තමේන්තු කර ඇති මුදල රු. 10,000.00 කි.

## ➢ වෙනත් ආදායම් 2:62

ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය මගින් නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර හා වෙනත් අලෙවිකිරීම් මගින් **වර්ෂය** 2025 වෙනුවෙන් රු. 100,000.00 ක මුදලක් ඇස්තමේන්තු කර ඇත.

කොම්පෝස්ට් පොහොර 1kg ක් සඳහා රු.15.00 බැගින් අය කෙරේ. (100 kg දක්වා.)101 kg සිට 1000 kg දක්වා කිලෝ ග්‍රෑම් ග්‍රෑම් 1 ක් රු.12.00 බැගින්ද 1001 kg සිට ඉහලට කිලෝ ග්‍රෑම් 1 1 ක් රු.10.00 බැගින්ද අලෙවි කෙරේ.

- **වැටුප් ප්‍රතිපූර්ණය 2:71**

ස්ථිර කාර්යය මණ්ඩලයේ සේවකයන් 16 දෙනෙකු වෙනුවෙන් හා අනියම් සේවකයන් 14 දෙනෙකු සඳහා වැටුප් ප්‍රතිපූර් ණ වශයෙන් අපේක්ෂිත වැටුප් ආධාර මුදල රු.19,387,766.40 කි.

- **පරිත්‍යාග 2:71(2)**

වෙනත් ආයතනවලින් ලැබෙන පරිත්‍යාග,ආධාර හා ත්‍යාග මෙම ශීර්ෂය යටතේ ගිණුම්ගත කරනු ලැබේ.

ආදායම් ඇස්තමේන්තුව - 2025

2. සෞඛ්‍ය සේවා

| වැඩ සටහන | ශීර්ෂය | 2022 සත්‍ය ආදායම (රු) | 2023 සත්‍ය ආදායම (රු) | 2024.09.30 ට සත්‍ය ලැබීම (රු.) | 2024 ඇස්තමේන්තුව | 2025 ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|---|
| 10 වර්පනම් හා බදු | | | | | | |
| විශේෂ බදු (කර්මාන්ත බදු/ ව්‍යාපාර බදු/ වෘත්තීය බදු ආදිය) | 2.16 | 777,400.00 | 986,200.00 | 530,800.00 | 800,000.00 | 800,000.00 |
| එකතුව | | **777,400.00** | **986,200.00** | **530,800.00** | **800,000.00** | **800,000.00** |
| 30 බලපත්‍ර ගාස්තු | | | | | | |
| වෙළඳ බලපත්‍ර | 2.31 | 396,000.00 | 482,500.00 | 269,300.00 | 500,000.00 | 500,000.00 |
| වෙනත් (පාරිසරික බලපත්‍ර ගාස්තු ආදිය) | 2.37 | 153,500.00 | 112,500.00 | 104,000.00 | 300,000.00 | 170,000.00 |
| එකතුව | | **549,500.00** | **595,000.00** | **373,300.00** | **800,000.00** | **670,000.00** |
| 40 සේවා සඳහා ගාස්තු | | | | | | |
| අයකර ගත හැකි ගාස්තු (ගලි බවුසර් හා ජල බවුසර් ගාස්තුද ඇතුළුව | 2.43 | 1,228,505.50 | 1,309,280.00 | 1,331,225.00 | 1,000,000.00 | 1,300,000.00 |
| පොදු වැසිකිලි | 2.43(1) | 181,515.18 | 137,022.36 | 103,678.02 | 200,000.00 | 150,000.00 |
| ආදාහනාගාරය | 2.43(11) | 2,998,000.00 | 2,910,525.00 | 2,842,800.00 | 2,500,000.00 | 3,000,000.00 |
| පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ පරීක්ෂණ ගාස්තු | 2.44 | 29,000.00 | 19,000.00 | 38,500.00 | 30,000.00 | 15,000.00 |
| එකතුව | | **4,437,020.68** | **4,375,827.36** | **4,316,203.02** | **3,730,000.00** | **4,465,000.00** |
| 50 වරෙන්තු ගාස්තු හා දඩ | | | | | | |
| වරෙන්තු ගාස්තු (දඩකුලී) | 2.51 | 16,051.31 | - | | 10,500.00 | - |
| පොදු වැසිකිලි දඩ | 2.51(1) | | 8,660.55 | 17,984.00 | | 10,000.00 |
| එකතුව | | **16,051.31** | **8,660.55** | **17,984.00** | **10,500.00** | **10,000.00** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 60 වෙනත් ආදායම් | | | | | | |
| විකුණුම් (කොම්පෝස්ට් පොහොර විකිණීමේ ආදායම්ද ඇතුළුව) | 2.62 | 142,560.00 | 42,961.00 | 12,925.00 | 100,000.00 | 100,000.00 |
| එකතුව | | **142,560.00** | **42,961.00** | **12,925.00** | **100,000.00** | **100,000.00** |
| 70 ආදායම් ආධාර | 2.71 | | | | | |
| වැටුප් ප්‍රතිපූර්ණ | | 6,501,704.56 | 6,704,089.46 | 6,142,309.58 | 12,352,920.00 | 19,387,766.40 |
| පරිත්‍යාග/ආධාර/ත්‍යාග ආදිය | 2.71(2) | | | | | 10,000.00 |
| එකතුව | | **6,501,704.56** | **6,704,089.46** | **6,142,309.58** | **12,352,920.00** | **19,397,766.40** |
| පුනරාවර්තන ආදායම් එකතුව | | **12,424,236.55** | **12,712,738.37** | **11,393,521.60** | **17,793,420.00** | **25,442,766.40** |
| එකතුව | | **12,424,236.55** | **12,712,738.37** | **11,393,521.60** | **17,793,420.00** | **25,442,766.40** |
| ආදායම් සාරාංශය | | | | | | |
| පුනරාවර්තන ආදායම් | | 12,424,236.55 | 12,712,738.37 | 11,393,521.60 | 17,793,420.00 | 25,442,766.40 |
| ප්‍රාග්ධන ආදායම් | | - | - | - | - | - |
| මුළු එකතුව | | **12,424,236.55** | **12,712,738.37** | **11,393,521.60** | **17,793,420.00** | **25,442,766.40** |

## වියදම් ඇස්තමේන්තුව - 2025

### 2.සෞඛ්‍ය සේවා

| වැඩ සටහන | ශීර්ෂය | උප ශීර්ෂ | 2022 සත්‍ය වියදම (රු) | 2023 සත්‍ය වියදම (රු) | 2024.09.30 ට සත්‍ය වියදම (රු.) | 2024 ඇස්තමේන්තුව | 2025 ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|---|---|
| **01.** වැටුප් හා දීමනා | 201 | | | | | | |
| වැටුප් හා වේතන (ස්ථිර) | | 201 | 6,562,618.52 | 6,765,481.46 | 6,439,455.19 | 12,352,920.00 | 10,267,920.00 |
| වැටුප් හා වේතන (අනියම්) | | 201(1) | 5,378,509.76 | 7,379,482.00 | 6,045,019.83 | 9,489,600.00 | 8,322,720.00 |
| වැටුප් හා වේතන (ප්‍රතිපූරණය නොවන ) | | 201(1)1 | | | | | 3,063,000.00 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | | 201(2) | 318,196.83 | 726,853.00 | 634,983.84 | 500,000.00 | 900,000.00 |
| වෙනත් දීමනා (ප.ආ.බ. ගාස්තු නිකුත් කිරීමේ කමිටුව හා ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තු ඇතුළු) | | 201(9) | 21,693.00 | 20,133.28 | 48,492.95 | 50,000.00 | 100,000.00 |
| එකතුව | | | **12,281,018.11** | **14,891,949.74** | **13,167,951.81** | **22,392,520.00** | **22,653,640.00** |
| **02** ගමන් වියදම් | 202 | | | | | | |
| ගමන් වියදම් (කා.ම.) | | 202(1) | 3,420.00 | 117,138.00 | 99,184.00 | 100,000.00 | 150,000.00 |
